**ශීර්ෂය 16 - පාර්ලිමේන්තුව**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

පාර්ලිමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 04 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 නොවැම්බර් 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර, ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී . වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- පාර්ලිමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) මෙම වාර්තාවේ 1.6.4.(අ) ඡේදයෙහි ඇතුලත්වූ නිරීක්ෂණය සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 වර්ෂයේ අයවැය සංඛ්‍යාත්මක අගයන් හා 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අගයයන් අතර වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ රු.950,000 ක්ද, අනෙකුත් භාණ්ඩ හා සේවා රු.19,428,000 ක්ද, සහනාධාර ප්‍රදාන සහ මාරුකිරීම් රු.64,260,000 ක්ද, මුළු පුනරාවර්තන වියදම රු.84,638,000 ක්ද සහ මූලධන වත්කම් අත්පත්කර ගැනීම් රු325,000 ක්ද ලෙස වෙනස්කම් පැවතුණි. | 2019 වර්ෂයේ අයවැය සංඛ්‍යාත්මක අගයන් හා 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එම අගයයන් සමාන විය යුතුය. | ඒසීඒ 2(1) හා ඒසීඒ (එෆ්) සමග සැසදේ. අනෙකුත් භාණ්ඩ හා සේවා සදහා වූ වියදම්වල එකතුවට ගමන් වියදම් එකතුවද ඇතුලත් කර දක්වා ඇත.මූලධන වත්කම් අත්පත් කර ගැනීම් යටතේ කල්බදු වාරිකය ඇතුලත් කර ඇත. ඒසීඒ 2(1) අනුව මුළු පුනරාවර්තන වියදම් සමග ගැලපේ. අයවැය ඇස්තමේන්තුවල වැටුප් වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ වල මුළු අගය සඳහා දේශීය හා විදේශීය ගමන් වියදම්ද ඇතුලත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශනයේ එය ඇතුලත් කර ඇත්තේ අනෙකුත් භාන්ඩ හා සේවා යටතේය. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ). සමාලෝචිත වර්ෂය අවසානයට කල්බදු වත්කම් වෙනුවෙන් ගෙවිය යුතු ඉතිරි වටිනාකම සහ කල්බදු ආයෝජන වටිනාකම වූ රු.8,425,718 ක් ශේෂ පරික්සුමෙහි නිවැරදිව නිරූපණය වී නොතිබුණු අතර, එ් අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ (ඒසීඒ-පී ආකෘතියෙහි) මූල්‍ය නොවන වත්කම් යටතේ කල්බදු ආයෝජන සහ ජංගම වගකීම් යටතේ කල්බදු ණය හිමියෝ වශයෙන් එම ඉතිරි වටිනාකම වූ රු.8,425,718 ක අගය ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල කල්බදු වත්කම් වාර්තා කිරීමේදී මූල්‍ය නොවන වත්කම් යටතේ කල්බදු ආයෝජන සහ ජංගම වගකීම් යටතේ කල්බදු ණය හිමියෝ ලෙස ඉතිරි වටිනාකම ඇතුලත් කළ යුතුය. | කල්බදු වත්කම් වටිනාකම මුල් වරට ගිණුම් ගත කරන විට ප්‍රමාද දෝෂයකින් වත්කමෙහි මුළු වටිනාකම වෙනුවට වාරික පමණක් ගිනුම් ගත වී තිබූ අතර එය පසුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට ගොස් නිවැරදි කර ගන්නා ලදී. තවද, ඒසීඒ-පී ආකෘතියෙහි දේපොල පිරියත හා උපකරණ සංචිතය යටතේ කල්බදු ණය හිමියන්ගේ වටිනාකම දක්වා ඇති අතර භාණ්ඩාගාර අකෘතිය අනුව එය වෙනම දැක්වීම සඳහා ස්ථානයක් නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂයේදී අපහරණය කල බවට කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කර තිබුණු යතුරු පැදි 05 ක් සහ ටාටා වර්ගයේ බස් රථය, මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ 06 ආකෘතිය) අපහරණ යටතේ ඇතුළත් කර නොතිබුණි. | අපහරණයන් ඒසීඒ 06 ආකෘතියේ අපහරණ යටතේ ඇතුළත් කල යුතුය. | එකඟ වේ. නිසි පරිදි ලැබීම් නියෝග 2019 වර්ෂයේ ලැබී නොතිබුණ බැවින් වත්කම් වලින් ඉවත් නොකර තිබූ අතර එය 2020 වර්ෂයේදී ගිණුම් තබා අවසන් කර ඇත. |
| (ඇ) | 2013 ජනවාරි 24 දිනැති අංක එස්ඒ/ඒඑස්/ඒඒ/චක්‍රලේඛ දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3 ඡේදයෙහි ජංගම නොවන වත්කම් තක්සේරු කිරීම පිළිබඳ විස්තර දක්වා ඇතත්, පාර්ලිමේන්තුව සතු මාදිවල නිවාස සංකීර්ණය, නුවරඑළියේ සෙන්පති මැදුර, අනුරාධපුර මෙත් සෙවන සහ ශ්‍රාවස්ථි මන්දිරය ඉදිකළ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගතකිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි. | 2013 ජනවාරි 24 දිනැති අංක එස්ඒ/ ඒඑස්/ඒඒ/චක්‍රලේඛ ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. | එකඟ වේ. අවශ්‍ය සියළුම ලිය කියවිලි රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර තක්සේරුව ලද පසු ගිණුම් ගත කරනු ලැබේ. |
| (ඈ) | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පරිත්‍යාග ලෙස ලැබුණු වත්කම් පරිත්‍යාග ලේඛණයක ඇතුළත් කර නොතිබුණ අතර, එම වත්කම් තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිත්‍යාග ලේඛණයක ඇතුළත් කර තක්සේරු කර ගිණුම් ගත කල යුතුය. | එකඟ වේ. වටිනාකම ලද වත්කම් ගිණුම් ගත කර ඇති අතර අනෙකුත් සියළුම වත්කම් වටිනාකම ලද පසු ගිණුම් ගත කිරීමත් පරිත්‍යාග ලේඛණය 2020 වසර තුළ පිළියෙල කිරීමටත් කටයුතු යොදා ඇත. |

### 1.6.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ වෙනත් නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රථ වාහන අනතුරු 02 ක් සහ පාර්ලිමේන්තු සභා ගර්භයේ ඇති වූ නොසන්සුන්තාවය හේතුවෙන් සභා ගර්භයේ කථන පද්ධතියට සහ නිලධාරීන්ගේ මැදිරිවලට සිදුවී තිබූ අලාභයන්හි එකතුව රු.459,617 ක් සහ තවදුරටත් අයකරගැනීමට/කපාහැරීමට හෝ අත්හැරීමට සිදුවන පාඩුව වන රු.172,251 ක්, 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පොත්වලින් කපාහැරීමේ ප්‍රකාශනයෙහි (සටහන ii) ඇතුළත් නොකර, එම අලාභය (සටහන i) පාඩු හා අත්හැරීම් ප්‍රකාශයෙහි ඇතුළත් කර තිබුණි. | නිවැරදි ආකෘතිවල ඇතුලත් කළ යුතුය. | එකඟ වේ. |

### 1.6.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය රු.124,446,206 ක් හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව රු.123,947,946 වූයෙන්, ඒ අතර රු.498,260 ක වෙනසක් පැවතුණි. | අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ එකතුව සමාන විය යුතුවේ. | අත්තිකාරම් පාලන ගිණුම හා කේවල ශේෂ අතර වෙනසට හේතු වී ඇත්තේ කාර්ය මණ්ඩලවල සාමාජිකයින් විශ්‍රාම ගැන්වීමේදී විශ්‍රාම පාර්තෝෂියෙන් අයකර ගන්නා ලද ශේෂයන් හරස් සටහන් මගින් නිරවුල් කර ඇති නමුත් පරිගනක වැඩසටහනින් ඉවත් කර නොමැති වීමය. |

### 1.6.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | මුදල් රෙගුලාසි 104, 109 | 2019 වර්ෂයේ සිදුවී තිබුණු අනතුරු 10 ක රු.747,482ක අලාභයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කළ යුතු පොදු 283, 284 සහ 285 වාර්තා වල පිටපත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එකඟවේ. |
| (ආ). | **රාජ්‍ය මුදල් චක්‍රලේඛ** | | | |
| | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන චක්‍රලේඛයේ 03 ඡේදය | නියමිත කාලරාමු තුළ 2019 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය අවසන් කර, සමීක්ෂණ වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත්කර නොතිබුණි. | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාවලිය අවසන් කර, සමීක්ෂණ වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. | එකඟවේ. කොවිඩ් වසංගතය හේතුවෙන් අඩල වූ 2019 වසරට අදාල භාණ්ඩ සමීක්ෂණයේ කටයුතු 2020 ජුලි මාසයේ ආරම්භ කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ). | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් 2017 මැයි 04 දින නිකුත් කර ඇති අංක 02/2017 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සහ 2016 දෙසැම්බර් 22 දිනැති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අංක 2004/පුස/1(2016-සංශෝධිත) දරන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | 2019 දෙසැම්බර් 31 දිනට පැවැත්විය යුතු පුස්තකාල පොත් සමීක්ෂණය පවත්වා තිබුණේ 2019 දෙසැම්බර් 06 දිනට වූ අතර, එදිනට පොත් 91 ක ඌනතාවයක් පැවතුණි. | ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | පාර්ලිමේන්තු පුස්තකාලයේ 2019 වසර අදාල පොත් සමීක්ෂණය සිදු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිලිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබද සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2019 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව, ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.2,879,893 ක් වූ අතර, එයින් රු.1,394,202ක් වර්ෂ 01 සිට වර්ෂ 24 දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | හිඟහිටි ණය ශේෂ අය කර ගැනීමට සියළු උත්සාහයන් දරා ඇත. ඒ අනුව රු.384,502 ක් 2019 වර්ෂය තුල අයකර ගැනීමට සමත් විය. |

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ). | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය අනුව, සටහන iii යටතේ වන බැඳීම් හා බැරකම් | බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් | විගණන විමසුමෙහි දක්වා ඇති භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳ ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතු අතර, එලෙස වාර්තා නොකළ කිසිදු බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස 2020 වර්ෂයේදී නිරවුල් නොකළ යුතු වුවත්, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශයේ සඳහන් නොවන රු.216,177,251 ක පුනරාවර්තන වියදම් 2020 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතුය. | ප්‍රකාශයේ අගය නිවැරදි නොවේ. |
| (ආ). | මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) හි වාර්තා කර තිබුණු එකතුව රු.7,521,315 ක් වූ බැදීම් හා බැරකම්, බැරකම් ලේඛනයේ ඇතුළත් වී නොතිබුණි. | බැදීම් හා බැරකම්, බැරකම් ලේඛනය සමඟ විය යුතුය. | ගිණුම් වාර්තාව සකස් කරන විට අදාල බිල්පත් ලැබී නොතිබු හෙයින් බැරකම් ලේඛණයට ඇතුලත් කිරීමට නොහැකි විය. |
| (ඇ). | බැරකම් ලේඛනයේ ගෙවිය යුතු බැරකම් ලෙස ඇතුළත් වී තිබුණු රු.37,166,928 ක බැරකම්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) හි වාර්තා වී නොතිබුණි. | බැදීම් හා බැරකම්, බැරකම් ලේඛනය සමඟ විය යුතුය. | මුදල් අංශයට එවීම පමා වී ඇති නිසා මූල්‍ය ප්‍රකාශනවල සටහන (iii) හි ඇතුලත් කිරීමට නොහැකි වී ඇත.කෙසේ වෙතත් ඉදිරියේදී එවැනි පමා කිරීම් සිදු නොවන ලෙස කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දුනිමි. |
| (ඈ). | මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව, සැපයුම් හා සේවා සම්බන්ධයෙන් වාර්ෂිකව පුනරාවර්තනය වන වියදම්වලට අදාල වැය විෂයය යටතේ බැරකම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල සටහන (iv) යටතේ දැක්විය යුතු වුවද, සැපයුම් හා සේවා යටතේ වූ බැදීම් හා බැරකම් වලට අදාල නොවන එකතුව රු.15,424,808 ක බැරකම්, සටහන (iv) යටතේ දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | අදාළ අංශ මඟින් නියමිත දිනට පසුව මුදල් අංශයට තවත් බැරකම් ඉදිරිපත් කර ඇති බැවින් ඒවාද බැරකම් ලේඛණයට ඇතුලත් කිරීමට සිදුවිය. කෙසේ වෙතත් ඉදිරියේදී එවැනි පමා කිරීම් සිදු නොවන ලෙස කටයුතු කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දුනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 කාර්යසාධනය

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වීම**

2019 වර්ෂයේ පාර්ලිමේන්තු රැස්වීම් 93 ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ අතර වර්ෂය තුළ රැස්වීම් 90 ක් පවත්වා තිබුණි. එම රැස්වීම් 90 සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය පහත පරිදි විය.

| සහභාගී වී තිබුණු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සංඛ්‍යාව | පවත්වා තිබුණු රැස්වීම් ගණන |
|---|---|
| 01 සිට 25 දක්වා | 00 |
| 26 සිට 50 දක්වා | 01 |
| 51 සිට 75 දක්වා | 03 |
| 76 සිට 100 දක්වා | 06 |
| 101 සිට 125 දක්වා | 13 |
| 126 සිට 150 දක්වා | 21 |
| 151 සිට 175 දක්වා | 26 |
| 176 සිට 200 දක්වා | 16 |
| 201 සිට 225 දක්වා | 04 |
| **එකතුව** | **90** |

ඉහත සඳහන් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබුණු මුළු රැස්වීම් 90 න් එක් රැස්වීමක් සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 50 කට වඩා අඩුවෙන් සහභාගීවී තිබුණු අතර, රැස්වීම් වාර 04 ක් සඳහා ගරු මන්ත්‍රීවරුන් 200 කට වඩා වැඩියෙන් සහභාගී වී තිබුණි.

(ආ) **පනත් කෙටුම්පත් සම්මත කිරීම**

2019 වර්ෂය තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ පනත් කෙටුම්පත් 41 කින් 24 ක් පාර්ලිමේන්තුව විසින් සම්මත කර තිබුණු අතර, ඉදිරිපත් කරන ලද පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් සංඛ්‍යාව 06 කි.

(ඇ) **රාජ්‍ය ගිණුම් කාරක සභාව**

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් 2019 වර්ෂයේදී අවස්ථා 31 කදී ආයතන 20 ක කාර්යසාධනය සහ වර්තමාන කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා කාරක සභා රැස්වීම් 31 ක්ද, විශේෂිත කරුණු පිළිබඳව විමර්ශන 11 ක්ද පවත්වා තිබුණි ගිණුම් කාරක සභාව විසින් රාජ්‍ය . විමර්ශනයට භාජනය කල ආයතන ඇතුළත් වාර්තා 03 ක් ෂයේදීවර් 2019 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි .

(ඇ) **පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව**

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2019 වර්ෂයේදී ආයතන 37 ක කාර්යසාධනය සහ වර්තමාන කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා කාරක සභා රැස්වීම් පවත්වා තිබූ අතර විමර්ශනය කරන ලද ආයතන සම්බන්ධව වාර්තා 04 ක් සමාලෝචිත වර්ෂයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි .

(ඉ) **මහජන පෙත්සම් කාරක සභාව**

2019 වර්ෂය තුළ කාරක සභාවට ලැබී තිබූ පෙත්සම් ගණන 586 ක් වූ අතර වර්ෂය තුළ රැස්වීම් වාර 33 ක් පවත්වා එයින් පෙත්සම් 421 ක් සලකා බලා තිබුණි. එයින් පෙත්සම් ගොනු 179 ක් අවසන් කර පෙත්සම්කරුවන් 06 ක් සඳහා සහන ලබා දී තිබුණි.

**3.2 ගොවිජන මන්දිරය පවරා ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම හා අතිරේක කාර්යාල ඉඩකඩ අවශ්‍යතාවය යන මැයෙන් 2015 සැප්තැම්බර් 21 දිනැති අංක 15/1301/702/007 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව පාර්ලිමේන්තුවට අවශ්‍ය වන ඉඩකඩ සපයා ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග 02 ක් යෝජනා වී තිබුණු අතර, එයින් පලමු යෝජනාව අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය පැවති ගොවිජන මන්දිරය අත්පත් කර ගැනීම වඩාත් ඵලදායී වන බව තීරණය කර තිබුණි.<br>ඒ අනුව ගොවිජන මන්දිරය පාර්ලිමේන්තුවට ගැලපෙන ලෙස සකස් කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් අංක 16-01-02-2509 දරන වැය විෂයය යටතේ වෙන් කර තිබූ රු.275,000,000 ක ප්‍රතිපාදයෙන් රු.161,934,795 ක මුදලක් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වැය කර එය ප්‍රතිසංස්කරණය කර තිබුණි. ඊට අමතරව පාර්ලිමේන්තුව විසින් විදුලිය හා ජලය සඳහා පුනරාවර්ථන වියදම් ලෙස එකතුව රු.6,747,036 ක මුදලක් 2018 වර්ෂය සහ 2019 වර්ෂවල ගෙවා තිබුණි.<br>2019 දෙසැම්බර් 18 දිනැති අමාත්‍ය | සාක්ෂාත් කර ගත හැකි ප්‍රතිපත්ති තීරණ පමණක් ක්‍රියාත්මක කිරීම සුදුසු වේ. | 2015 වර්ෂයේදී රජය විසින් ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම පිණිස තීරණය කිරීම තුළ ඒ සඳහා අවශ්‍ය පරිදි ඉඩකඩ සැලසීමේ අසීරු අභියෝගයකට මුහුණ දීමට සිදුවිය.ඒ අනුව කැබිනට් මණ්ඩලය විසින් එවකට කෘෂිකර්ම අමාත්‍යාංශය ස්ථාපනය කර තිබූ ගොවිජන මන්දිර පරිශ්‍රය පාර්ලිමේන්තුවට පවරීමේ රජයේ යෝජනාව අනුමත කරන ලදී.ඉදිකිරීම් කටයුතු සිදු කොට වසර 21 සම්පූර්ණව පැවති මෙම ගොඩනැගිල්ල පාර්ලිමේන්තු කමිටු පැවැත්වීමට සුදුසු තත්වයට නවීකරණය කර ගැනීමේ දැඩි අවශ්‍යතාවයක් පැන නැගුණු බැවින් නාගරික සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය හරහා නාවික හමුදාවට එම වගකීම පැවරීමට තීරණය කරන ලදී.අත්‍යාවශ්‍යව පැවති එම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා රු.මිලියන 162 ක් නාගරික සංවර්ධන අධිකාරියටත් පුනාරාවර්ථන වියදම් සඳහා රු මිලියන 06 වැය කර ඇති අතර ප්‍රතිසංස්කරණ කටයුතු නිමවීමෙන් |

| | | |
|---|---|---|
| මණ්ඩල තීරණය ප්‍රකාරව කෘෂිකර්ම අමාත්‍යාංශය නැවත ගොවිජන මන්දිර ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම හේතුවෙන් එම ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණය හා පුනරාවර්තන වියදම් සඳහා පාර්ලිමේන්තු වැය ශීර්ෂය යටතේ දරන ලද රු.168,681,831 ක මුදලින් අපේක්ෂා කල පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම හා අතිරේක කාර්යාල ඉඩකඩ අවශ්‍යතාවය ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | | පසු සමස්ථ ගොඩනැගිලි පරිශ්‍රයෙහිම භාවිතයට ගත හැකි ඉඩ ප්‍රමාණය ඵලදායි ලෙස යොදා ගනු පිණිස කාර්යාල සඳහා ඉඩ කඩ වෙන් කිරීමේ සැලැස්මක් ද සකසා තිබුණි. ඒ අනුව ඉදිකිරීම් කටයුතු සිදු කොට වසර 21 සම්පූර්ණව පැවති මෙම ගොඩනැගිල්ල ඵලදායි ජීවිත කාලය වැඩිකිරීමට වැය කරන ලද මුදල රජයට සිදුවූ පාඩුවක් නොවේ. |

## 3.3 ප්‍රසම්පාදන කාර්යයෙන් බැහැරව කටයුතු කිරීම

පාර්ලිමේන්තුවේ ඇතුළත මාර්ගයන්හි පදික වේදිකාව සකස් කිරීම හා කාපට් ඇතිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රු.මිලියන 167 ක් වෙන් කර හැකි ඉක්මණින් නිම කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබූ උක්ත කාර්යය සඳහා ප්‍රසම්පාදන කටයුතු සඳහා සති 3 ක්ද, භෞතික වැඩ සඳහා සති 12 ක කාලයක් ගත වන බව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් දන්වා තිබූ නමුත්, බලාපොරොත්තු වූ කාලය තුළ නිම කර නොතිබුණි. වසර 2කට පසු එනම් 2019 ජූලි 01 දින වැඩ අවසන් කර ඇති බව එදින මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරු (කොළඹ) විසින් දන්වා තිබුණි. එසේ වුවද, ගේට්ටු අංක 03 සිට පින්නියර දක්වා මාර්ගය දෙපස පදික වේදිකා සකස් කිරීමේ කටයුතු හා ගේට්ටු අංක 01 සිට ගේට්ටු අංක 02 දක්වා විදුලි පහන් කණු සවිකිරීමේ කටයුතු මේ වන තෙක් අවසන් කර නොමැති බව හා ඊට අමතරව නොකඩවා සිහි කැඳවීම් කලද වැඩ ප්‍රගතිය | නියමිත කාලය තුළ කාර්යය නිම කර යුතුය. | පාර්ලිමේන්තුවේ සේවා සංයුතිය අනුව ඉංජිනේරු අංශයේ කාර්ය මණ්ඩලය පාර්ලිමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය උපරිමයෙන් ඉටුකිරීම සඳහා අවශ්‍ය දායකත්ව සේවාවන් වන එදිනෙදා නඩත්තු කටයුතු සිදුකිරීම සඳහා සිය ශ්‍රම දායකත්වය සපයනු ලබයි.කෙසේ වෙතත් පාර්ලිමෙන්තු ගොඩනැගිලි පරිචය ආශ්‍රිතව පැනනගින විශේෂිත නඩත්තු කටයුතු සිදු කිරීම හා හැසිරවීමට ප්‍රමාණවත් පරිචයක් ඔවුන් සතුව නොමැත. එම නිසා සහ ආරක්ෂක කරුණු මත පාර්ලිමෙන්තු ගොඩනැගිලි පරිචය ආශ්‍රිතව පැනනගින විශේෂිත නඩත්තු කටයුතු සිදු කිරීම රජයේ සහ අනුබද්ධ ආයතන ලවා සිදු කර ගන්නා අතර එම සේවකයින් ඉතා වගකීම් සහගතව පාර්ලිමේන්තු පරිශ්‍රයේ |

| | | | |
|---|---|---|---|
| | ඉතා අසතුටුදායක බවත් පාර්ලිමේන්තුවේ සම්බන්ධීකරණ ඉංජිනේරු විසින් 2019 ජුනි 28 දින පාර්ලිමේන්තු මහ ලේකම් වෙත වාර්තා කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දින වන විටද අලුත්වැඩියා කටයුතු අවසන් කර නොතිබුණි. | | නඩත්තු කටයුතු සඳහා යොදවනු ලබයි. ඔවුන් පිළිබද නිරන්තර අධීක්ෂණ කටයුතු සිදු කරනු ලබයි. එම ආයතනය ඉදිරිපත් කරනු ලබන පිරිවැය ඇස්තමේන්තුව මත ප්‍රමාණවත් මුදල් මහා භාණ්ඩාගාරයෙන් වෙන්කරවා ගෙන එම මූල්‍ය වර්ෂය තුලදීම රාජ්‍ය ආයතනය වෙත ලබා දී කටයුතු අවසන් කර ගැනීමට පාර්ලිමේන්තුව උත්සාහ කරයි. මෙම කාර්යය සඳහා මාර්ග සංවර්ධන අධිකාරය පූර්ණ සේවා දායකත්වය සැපයූ අතර තවත් රාජ්‍ය ආයතනයක් සමග කටයුතු කිරීමේදී දක්වනු ලබන උපරිම විශ්වාසය පලකරමින් ක්‍රියාවලිය පුරා අවශ්‍ය සිහිකැදවීම් හා කරුණු දැක්වීම් ලිඛිතව සිදු කරමින් පාර්ලිමේන්තුව විසින් සිය පසු විපරම් කිරීමේ වගකීම හැකි උපරිම අයුරින් ඉටුකල බව දන්වනු කැමැත්තෙමි. |
| **(ආ).** | ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තු මුදල වූ රු. 172,321,000 න් රු.167,000,000 ක් 2017 වර්ෂය තුළ ගෙවා අවසන් කර තිබුණි. එම වටිනාකම මුළු ඇස්තමේන්තු මුදලින් සියයට 97 ක් වුවද, එම මුදල ගෙවීමේදී රැදවුම් මුදල් අඩුකර ගැනීමට හෝ අදාළ ගෙවීම් කිරීමට පෙර කරන ලද වැඩ කොටස් ඇගයීමට ලක් කිරීමට හෝ අවසන් කළ වැඩ පිළිබඳව වගකිව යුතු පුද්ගලයෙකු විසින් සහතික කිරීමක් හෝ සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉහත පිළිතුර අදාල වේ. |
| **(ඇ)** | රු.172,321,000 ක් වූ මුල් ඇස්තමේන්තුව 2018 ඔක්තෝබර් 16 සහ 2019 අප්‍රේල් 30 යන දිනවලදී සංශෝධනය කර තිබුණු නමුත්, 2012 අගෝස්තු 07 දිනැති අංක 02/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි. තවද, 2017 ජුනි 20 දින මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති විසින් ඇස්තමේන්තු අගයයන් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමෙන් පසු සුළු සංශෝධන වලට ලක් විය හැකි බව දන්වා තිබූ නමුත්, ඇස්තමේන්තු අගය | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉහත පිළිතුර අදාල වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.67,018,000 කින් වැඩිවී තිබුණි. එම අගය වැඩිවීම ඒවා සත්‍ය ලෙස වැඩි වී තිබුණේද යන්න පාර්ලිමේන්තුව විසින් (මැනුම් සිදු කර) සනාථ කරගෙන නොතිබුණි. | | |
| (ඈ) | ගේට්ටු අංක 01 හා 02 අතර පෙරමුසු ඇතිරීමෙන් පසු ඇතිවී ඇති රැලි සහිත ස්වභාවය පිළිබඳව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ඇතුළු මාර්ගය භාවිතා කරන්නන් පැමිණිලි කර තිබුණු අතර, අභ්‍යන්තර මාර්ග පද්ධතිය අලුත්වැඩියාවේදී සිදුවී ඇති අඩුපාඩු 24 ක් සම්බන්ධයෙන් වාර්තා කර තිබුණද, එම අඩුපාඩු නිවැරදි කර නොතිබුණි. | කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී විධිමත් ගිවිසුමකට එළඹිය යුතුය. | ඉහත පිළිතුර අදාල වේ. |
| (ඉ) | ගේට්ටු අංක 01 හා 02 අතර පෙරමුසු ඇතිරීමෙන් පසු ඇතිවී ඇති රැලි සහිත ස්වභාවය හේතුවෙන් අතුරා තිබූ පෙරමුසු ඉවත් කර නැවත ඇතිරීමට සිදුවී තිබුණු අතර, මේ සඳහා අමතර පිරිවැයක්ද දැරීමට සිදුවී තිබුණි. | කොන්ත්‍රාත්තුව පිරිනැමීමේදී විධිමත් ගිවිසුමකට එළඹිය යුතුය. | ඉහත පිළිතුර අදාල වේ. |
| (ඊ) | සති 15 ක් තුළදී පාර්ලිමේන්තුවේ ඇතුළත මාර්ගයන්හි පදික වේදිකාව සකස් කිරීම හා කාපට් ඇතිරීමේ කාර්ය නිම කර ගැනීමට අපේක්ෂාවෙන් ප්‍රසම්පාදන ක්‍රමයෙන් බැහැරව එම කාර්ය පාර්ලිමේන්තුව විසින් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත පවරා තිබූ අතර, එම ආයතනය විසින් එය මග නැගුම සමාගමටත්, මග නැගුම සමාගම විසින් පෙරමුසු ඇතිරීමේ කාර්යය අම්පාර දිස්ත්‍රික්කයේ පෞද්ගලික කොන්ත්‍රාත් සමාගමකටත් පවරා තිබුණි. එහෙත් එම පෞද්ගලික කොන්ත්‍රාත්කරුට ශක්‍යතාවයක් නොමැති බව අනාවරණය වූ අතර, 2017 අප්‍රේල් මස ආරම්භ කළ මාර්ගය කඩිනමින් ඉදිකිරීමේ කාර්යය 2019 වර්ෂයේදීද අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කළ යුතුය. | ඉහත පිළිතුර අදාල වේ. |

## 4 මානව සම්පත් කළමනාකරණය

## 4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය, පුද්ගල පඩිනඩි සඳහා වියදම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය විෂයය සඳහා රු.මි 1,185.89 ක් වැය කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **(i).** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 82 | 69 | 13 | - |
| **(ii).** | තෘතියික මට්ටම | 173 | 149 | 24 | - |
| **(iii).** | ද්විතියික මට්ටම | 295 | 231 | 64 | - |
| **(iv).** | ප්‍රාථමික මට්ටම | 520 | 492 | 28 | - |
| **(v).** | අනියම්/කොන්ත්‍රාත්/තාවකාලික | - | 20 | - | 20 |
| | **එකතුව** | **1070** | **951** | **139** | **20** |

ඉහත තොරතුරු අනුව 2019 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල පුරප්පාඩු 139 ක් හා අතිරික්ත 20 ක් විය.